ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

2018.08.09 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I** වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II, III, IV** කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06** ක් ද **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.
   (අ) "තෙහිං තකු// තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට"
   (ආ) "දිත්තම් දිතකු දොම් දොම් තා"
   (ඇ) "ජිමිත් තක්කිට තකට ජිමිතකු"

   (ii) පහත සඳහන් කවි පද මාත්‍රා තුනේ, තනි තිතට ප්‍රස්තාර කරන්න.
   "පෙර බුදු මඟුලට ගෙනා　　උඩැක්කිය
   ඒ බුදු මඟුලට ගැසූ　　උඩැක්කිය"

   (iii) උදාර වන්නමේ අඩව්ව හෝ තුන් තාලයේ ඉරට්ටිය හෝ යක් පද මාත්‍රයේ කලාසම ප්‍රස්තාර කරන්න.

2. "ශාන්තිකර්මවල ගායනය, වාදනය පමණක් නොව එහි සැරසිලි මෙන්ම රංගවස්ත්‍රාභරණ ද සුසංයෝග වේ"
   (i) පහන් මඩුවේ හෝ දෙවොල් මඩුවේ හෝ නර්තනාංග **දෙකක්** හඳුන්වා දී ඒ පිළිබඳ විමසුමක් කරන්න.
   (ii) කොහොඹා කංකාරියේ, ගායනය සහිත සහ ගායනය රහිත නර්තන අංගය බැගින් ගෙන ඒවායේ විශේෂතා විග්‍රහ කරන්න.
   (iii) සන්නියකුමේ එන සන්නි හා පාළි රංගනවල රංගවස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න.

3. (i) බලි ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණ පැහැදිලි කර එහි ගායනාවල සුවිශේෂතා පිරික්සන්න.
   (ii) නර්තන කලාවේ ආරම්භයට ප්‍රාථමික මානව සමාජ පසුබිම බලපෑ ආකාරය පෙන්වා දෙන්න.
   (iii) ආගමික හා සමාජයීය අවශ්‍යතා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත

## II කොටස

4. දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට විවිධ ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම වැදගත් වේ.
   (i) අනුරාධපුර යුගයේ පැවැති බෞද්ධාගමික පුද පූජා නර්තන කලාව පෝෂණයවීමට දායක වූ ආකාරය සාධක **තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.
   (ii) කවිකාර මඩුව, නැටුම් ඉලංගම් හා පෙරහර පැවැත්වීම සඳහා මහනුවර යුගයේ රජවරුන්ගෙන් සිදු වූ සේවාව කරුණු **තුනක්** යටතේ විග්‍රහ කරන්න.
   (iii) 20 වන සියවසේ නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් **දෙදෙනෙකුගේ** නර්තන නිර්මාණ සහ කලා කෘති පිළිබඳ අගයන්න.

[දෙවැනි පිටුව බලන්න.

www.artsapi.lk

5. (i) සම්ප්‍රදායික කවි හා ජන කවිවල සමානතා අසමානතා පෙන්වා දෙන්න.

(ii) රබන් කවියක් හෝ පන්තේරු කවියක් හෝ ගෙන එහි අන්තර්ගත තොරතුරු විමසුමට ලක් කරන්න.

(iii) කෝලම් හා සොකරි නාටකවලින් එක් චරිතය බැගින් තෝරාගෙන එම චරිතවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කරන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| පොෂ්වාන් | තිල්ලානා | මීනාක්ෂි සුන්දරම්පිල්ලේ |
| ලෙහෙඟා | බ්‍රින්දාවන් පරේං | රබින්ද්‍රනාත් තාගෝර් |
| ඔට්ටියානම් | තරානා | බ්‍රිර්ජු මහරාජ් |
| ශෙඃර්රි | කාලි ශාස්ත්‍රම් | වල්ලතෝල් නාරායන් මෙනන් |

(i) (අ) කොටසේ සඳහන් කථකලි නර්තන සම්ප්‍රදායේ රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.

(ii) (ආ) කොටසේ සඳහන් භරත නාට්‍යම් නර්තන අංගය තෝරා, එම නර්තනයේ විශේෂතා සාකච්ඡා කරන්න.

(iii) (ඉ) කොටසේ සඳහන් අය අතුරෙන් ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූ ප්‍රවීණ කලාකරු නම්කර, ඔහුගෙන් ඉටු වූ සේවය පිළිබඳ ඇගයීමක් කරන්න.

7. (i) දේශීය ජන ජීවිතය ඉස්මතු කිරීම සඳහා කරදිය මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරු විසින් කරන ලද උත්සාහය එම මුද්‍රා නාට්‍යය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ii) ප්‍රංශයේ බැලේ නාට්‍ය ප්‍රවර්ධනය වූ ආකාරය විමසුමට ලක් කරන්න.

(iii) මාර්තා ග්‍රැහැම්, ඉසඩෝරා ඩන්කන්, ජීන් ජෝර්ජ් නෝවැර්, මයිකල් ෆෝකින්ස් යන ශිල්පීන් අතුරෙන් **දෙදෙනකු** පිළිබඳ අගයන්න.

## IV කොටස

8. අද්‍යතන නර්තනයේ ප්‍රාසංගික බව මතු කිරීමට භාරතීය මෙන්ම බටහිර සංගීතයේ උපයෝගීතාව වඩාත් ප්‍රබල වී තිබේ.

(i) අද්‍යතන ප්‍රසංග නර්තනය සඳහා යොදා ගන්නා සංචලනවල ඖචිත්‍ය බව විග්‍රහ කරන්න.

(ii) ගීත නර්තන නිර්මාණකරණයට සංගීතයෙන් ලැබෙන පිටිවහල විග්‍රහ කරන්න.

(iii) ප්‍රාසංගික නර්තනයේ රංගවස්ත්‍රාභරණ භාවිතය පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ විචාරයක් කරන්න.

- ✳ සාම්ප්‍රදායික ලක්ෂණ
- ✳ නිර්මාණාත්මක ලක්ෂණ
- ✳ බටහිර ආභාෂය
- ✳ භාරතීය ආභාෂය

9. (i) රංග රචනය සහ චිත්‍ර සම්පිණ්ඩනය අතර සහසම්බන්ධතාව විස්තර කරන්න.

(ii) රූපවාහිනිය මගින් ඉදිරිපත් කෙරෙන නර්තන වැඩසටහන්, රසඥතා වර්ධනයට කෙසේ බලපාන්නේ දැයි විචාරය කරන්න.

(iii) සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි රංග ආභරණ ආකෘතියක් නිර්මාණය කර ගන්නා ආකාරය විමසන්න.

✳ ✳ ✳

www.artsapi.lk
කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත